**සබරගමුව අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**Covid 19-සතිපාසල් වැඩසටහන**

**නාට්‍ය හා රංගකලාව**

**12 ශ්‍රේණිය**

**2020/06/22 - 2020/06/26**

**නිපුණතාවය : 5.1.**නාට්‍ය පෙළ රසවිදියි.

**පාඩම :කුවේණි පෙළ රසවිඳීම**

***සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න .**

**කාර්‍ය පත්‍රිකා අංක 01**

01.කුවේණි නාට්‍යයේ රචකයා වන්නේ ,

i. ගුනසේණ ගලප්පත්ති
ii. හෙන්රි ජයසේන
iii. සුගතපාල ද සිල්වා
iv. සයිමන් නවගත්තේගම
v. එදිරිවීර සරච්චන්ද්‍ර

02.කුවේණි නාට්‍යය වේදිකාගත වූ වර්ෂය වන්නේ ,

i. 1960
ii. 1963
iii. 1969
iv. 1967
v. 1962

03.කුවේණි සම්බන්ධ ඓතිහාසික සිදුවීම සඳහන් වන මූලාශ්‍ර කාණ්ඩය වන්නේ ,

i. මහාවංශය, ථූපවංශය
ii. මහාවංශය ,දීපවංශය
iii. දීපවංශය ,ථූපවංශය
iv. මහාවංශය ,කුවේණි අස්න
v. රාජාවලිය ,ථූපවංශය

04.කුවේණි චරිතය නිර්මාණය කර ඇති ආකාරය සම්බන්ධ වඩාත් නිවැරදි ප්‍රකාශය වන්නේ ,

i. සදාතනිකව තම අයිතීන් භුක්ති විඳින්නියක් ලෙසය .
ii. කෘතවේදීත්වය වුවද පරදුවට තබා තම අභිමතාර්ථ ඉටුකරගන්නියක් ලෙසය .
iii. අතීතය හා වර්තමානය සම්බන්ධීකාරිනියක් ලෙසය .
iv. සදාකාලිකව අසාධාරණයට ලක්වන කාන්තාවගේ නියෝජනයක් ලෙසය .
v. මිනිස් සංහතියෙන් පලිගැනීමට අර අඳින යකින්නක් ලෙසය .

05.කුවේණි නාට්‍යය හා සම්බන්ධ චරිත කාණ්ඩය වන්නේ ,

i. විජය ,කුවේණි ,ජීවහත්ථ
ii. කුවේණි ,දඩයක්කරු,යක්ෂ ගෝත්‍ර නායක
iii. කුවේණි ,දිසාලා, මහෝෂධ
iv. ජීවහත්ථ ,දිසාලා ,පොතේගුරු
v. පූරක,කුවේණි ,මහෝෂධ

**කාර්‍ය පත්‍රිකා අංක 02**

01.කුවේණි නාට්‍යය රචනා කළ රචකයා සහ එය වේදිකාගත වූ වර්ෂය සඳහන් කරන්න .

02.කුවේණි වේදිකා නාට්‍යයට මූලාශ්‍ර වූ පුරාවෘත්තය අන්තර්ගත ඓතිහාසික කෘති

දෙකක් නම් කරන්න.

03.නාට්‍ය රචකයා කුවේණිය **සදාකාලික ගැහැනිය** වශයෙන් හඳුන්වා දී ඇත්තේ ඇයිදැයි

පැහැදිලි කරන්න .

04.කුවේණි නාට්‍යයේ චරිත නිර්මාණය නිදසුන් සහිතව පැහැදිලි කරන්න .

05.කුවේණි නාට්‍යය තුළින් ස්ත්‍රිය පිළිබඳ රචකයාගේ දෘෂ්දෘෂ්ටිකෝණය පැහැදිලි කරන්න .

**රචනා ප්‍රශ්න**

01.නව ආකෘතියක් සොයාගිය නාට්‍යයක් වශයෙන් කුවේණි නාට්‍යය සාර්ථක වී තිබේද ?

නිදසුන් සහිතව විස්තර කරන්න .

02.සමකාලීන නාට්‍ය අතර කුවේණි නාට්‍යය සුවිශේෂී වීමට හේතු පැහැදිලි කරන්න .

03.නාට්‍යයේ එන නූතන කුවේණිය අධිකරණයෙන් ඉල්ලා සිටින්නේ කුමක්ද යන්නත්

නඩුකාරවරයා ඊට දෙන පිළිතුරත් පිළිබඳ සාකච්ඡාවක් ගොඩ නගන්න.

04.නූතන කුවේණිය මුහුණ දුන් ගැටුම්කාරී අවස්ථාව පිළිබඳ ඔබේ ආකල්පය පැහැදිලි

කරන්න .